# කරන්දෙණිය ප්‍රාදේශිය සභාව
# 2023 මාර්තු මස මාසික මහ සභා රැස්වීමේ වාර්තාව

දිනය :-2023.03.10
ආරම්භය :-පෙ.ව 9.00
ස්ථානය :-කරන්දෙණිය ප්‍රාදේශිය සභා රැස්වීම් ශාලාව

එදින සහභාගීත්වය:-

| | |
|---|---|
| 01.ගාමිණී අමරවංශ මුණුගොඩ | ගරු සභාපති |
| 02.එස්.පී නිමල් බන්දු මැතිතුමා | ගරු උප සභාපති |
| 03.එම්.එස්.කපිල කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 04. අජිත් කුමාර කරුණාතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 05.ගාල්ලගේ ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 06. ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිනිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 07.බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 08. පී.එච්. සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 09. සමීර චතුරංග ආරියරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10.රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. .එච්.චම්පික කුෂාන් ගුණසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍ර |
| 12.මොහොමඩ් කියාස් මොහොමඩ් සිරාස් මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13.චන්ද්‍රිකා කාන්ති වීරසිංහ මැතිනිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14.ශ්‍රියාණි පුංචිහේවා මැතිනිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 15. ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 16.ඕ.කේ.ධම්මික සුසන්ත මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 17.කේ.ඩී.බන්දුසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 18.ඒ.ජී.හර්ෂණී දීපිකා මැතිනිය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

2023 මාර්තු මස මාසික සභා රැස්වීමට පැමිණි සියළුම ගරු මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් වගේම කාර්ය මණ්ඩලයත් සහ මාධ්‍යවේදීන් සියළුම දෙනාවත් ගෞරවයෙන් පිළිගනු ලබනවා. අද දින න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරමු.

## 2023 පෙබරවාරි මස මාසික සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

පසුගිය සභා වාර්තාව කියවුවා සේ සලකා 2023 පෙබරවාරි මස මාසික සභා වාර්තාවේ අඩු පාඩු හා වැරදි තිබෙනම් එම අඩුපාඩු පෙන්වා දී අඩු පාඩු නොමැතිනම් සභා වාර්තාව සම්මත කරන ලෙසට මම ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ද ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි. 2023 පෙබරවාරි මස සභා වාර්තාවේ සංශෝධන නොමැති බැවින් එම සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2023 පෙබරවාරි මස සභා වාර්තාවේ සංශෝධන නොමැති බැවින් එම සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

අද දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමල් හේවගේ මැතිතුමා අසනීප තත්වය හේතුවෙන් අද දින සභාවාරය සඳහා නොපැමිණෙන බව දැනුම් දී තිබෙනවා. ඒ වගේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා අද දින ප්‍රමාද වන බව ඇනුම් දුන්නා. අද දින න්‍යාය පත්‍රානුකූලව ඉදිරි කටයුතු කරගෙන යන්න සියළුම දෙනාගේ සහයෝගය මම බලාපෙරොත්තු වෙනවා.

## 03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

03.01. "අප්‍රේල් මස 18 වන දින ඌරගහ බක්මහ උළෙල " යන මැයෙන් යුතුව සිංහ ක්‍රීඩා සමාජය , ඌරගස්මංහන්දිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ගුණරත්න මැතිතුමා

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මේ අවුරුදු උත්සවය දීර්ඝ කාලයක් තිස්සේ ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පවත්වනු ලබන සංස්කෘතිය විදහා දක්වන ජාතික උත්සවයක් . රට හැදීගෙන එන මේ වෙලාවේ අපේ සහයෝගය මේ සඳහා ලබාදෙමු කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි මේ සඳහා සහයෝගය ලබා දෙමු.

03.02."වාර්ෂිකව පවත්වනු ලබන ලේ දං දීමේ කඳවුර සඳහා ගෞරවනීය ආරාධනය " යන මැයෙන් යුතුව ජනසුව ප්‍රජා සංවර්ධන පදනම, ඌරගස්මංහන්දිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා

අපි මේ ලේ දන් දිමේ කදවුර අප්‍රේල් 29 දින තමයි දාගන තිබුණේ. ඒත් මහරගම අපේක්ෂා රෝහලෙන් ඒ කඳවුර කඩිනම් කරන්න කියලා ඉල්ලීමක් කරපු නිසා අපි ඒ කදවුර මාර්තු 15 දින ඌරගස්මංහන්දියේ රතනසිරි ශාලාවේ පවත්වන්න තීරණය කළා. ඒ නිසා ශබ්දවාහිනී යන්ත්‍ර වලට යන වියදම සහා අරමුදලෙන් ලබා දෙන ලෙසයි මම මේ ඉල්ලීම කරන්නේ.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි මේ වගේ අවස්ථා වලදී අපේ සභාවේ සහයෝගය ලබා දිය යුතුයි. ඒ නිසා වැය අනුමැතියට ඉක්මනින් යවලා ඒ සඳහා කටයුතු කරමු.

03.03."අමරකීර්තිගම මාර්ගය ප්‍රතිසංස්කරණය කර ගැනීම සම්බන්ධව " යන මැයෙන් යුතුව අරුණෝදය සුභ සාධක සුහද සේවා සමිතිය, අමරකීර්තිගම බොරකන්ද, කරන්දෙණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.04." අඟනකැටිය ග්‍රාම නිළධාරි වසමේ විල්මන් මහතාගේ නිවස අසල සිට කුමුදු මහත්මියගේ නිවස දක්වා ඇති මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම " යන මැයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රමා ශ්‍රී විජේතුං මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.05. "විදුලි කණු 04 ක් ඉවත් කිරීම සහ අනාරක්ෂිත විදුලි සම්බන්ධතාවය වෙනස් කිරීම සම්බන්ධව " යන මැයෙන් ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු, ලංකා විදුලි බල මණ්ඩලය, අම්බලන්ගොඩ විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා

මාර්ග අළුත් වැඩියා කිරීමේදී සමහර විදුලි කණු හිටවලා තියෙන්නේ පාරේ. මේක ලොකු ගැටළුවක් වෙලා. නමුත් අපි මේ ගෙවීම කිරීම අවශ්‍ය වන්නේ නැහැ.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා.

අපි අම්බලන්ගොඩ විදුලි ඉංජිනේරු තුමා දැනුවත් කරමු. නිසි පරිදි දැන්වීමකින් අනතුරුව කණු සිටවන්න කියලා.

03.06."බෙලිගස්වේල්ල ප්‍රජා ශාලාව සඳහා ඉවත් කරන ලද මේසයක් ලබා ගැනීම " යන මැයෙන් ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.07."කැරුව- කැකිරිස්කන්ද හරහා ඌරගහ මාර්ගය අබලන්වීම සම්බන්ධවයි." යන මැයෙන් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, ගාල්ල විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.08."මල් කුටි හා පුටු සඳහා යන වියදම සහා අරමුදලින් ලබා ගැනීම." යන මැයෙන් අරුනළු උද්‍යාන විද්‍යා සංගමය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

2023.03.30,31 සහ 2023.04.01 යන දිනවල අරුනළු උද්‍යාන විද්‍යා සංගමය මඟින් පැවැත්වීමට කටයුතු යොදලා තියෙන මල් කුටි හා පුටු සඳහා යන වියදම පියවා ගන්න රුපියල් 25000.00 ක මුදලක් සභා අරමුදලින් ලබා දෙන ලෙසයි මේ ඉල්ලීම කරලා තියෙන්නේ. මේ දිනවල පවතින

තත්වය නිසා අපි මේ ලිපිය වැය අනුමැතියට යවලා අපිට ගෙවන්න කියලා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කිව්වොත් අපි ගෙවමු.

03.09." විදුලි බිල සම්බන්ධවයි යන මැයෙන් " යන මැයෙන් නුගේතිබ්බූකන්ද ප්‍රාදේශීය සභා පෙර පාසල් ගුරුතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

විදුලි බිල සම්බන්ධවයි යන මැයෙන් නුගේතිබ්බූකන්ද ප්‍රාදේශීය සභා පෙර පාසල් ගුරුතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. පසුගිය වසර වල පෙර පාසලෙහි විදුලි බිල ගෙවීම් සිදු කරලා තියෙන්නේ දෙමාපියන් එක් අයකුගෙන් රුපියල් 30.00 බැගින් වන පරිදි එකතුකරගන්නා මුදලින් . නමුත් දැන් පවතින ආර්ථික තත්වය හමුවේ එය ඉතා අසීරු කටයුත්තක් වෙලා තියෙන නිසා එම විදුලි බිල සභා අරමුදලින් ගෙවන ලෙස ඉල්ලීමක් කරලා තියෙනවා. මේ අපේ සභාවේ පෙරපාසලක්. ඒ නිසා මේ පෙරපාසලේ විදුලි බිල අපි සභා අරමුදලින් ඉදිරියට ගෙවීම කරමු.

03.10." ව්‍යවස්ථාපිත විගණන තොරතුරු ලබා ගැනීම " යන මැයෙන් වාහන විෂය භාර නිළධාරී ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

විගණන ආයතනයට ඉන්ධන නිකුත් කිරීම පිළිබඳවයි මේ ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නේ.අපේ ආයතනයට සේවාවක් සපයන ආයතන වලට අපි අවස්ථාව ලබා දිය යුතුයි.

03.11." සභාව සතු කඩකාමර බදු මුදල් සංශෝධනය කිරීම " යන මැයෙන් සභා ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපේ සභාවට අයිති වෙළෙඳ සංකීර්ණ බහුතරයක බදු මුදල් 2015 වර්ෂයට පස්සේ සංශෝධනය කරලා නෑ. අවම වසර 05 කට වරක් වත් බදු මුදල් සංශෝධනය විය යුතුයි. නැත්නම් ඒක විගණන ගැටළු ඇතිවෙන්න හේතුවක් වෙන්න පුළුවන්. ඒ වගේම දීර්ඝ කාලයකට පස්සේ බදු සංශෝධනයක් කළොත් විශාල වශයෙන් බදු මුදල් ඉහළ යන නිසා අපිට විරෝධතා ඇතිවෙන්නත් පුළුවන්. අනෙක් පැත්තෙන් සභාවට ලැබෙන්න තියෙන ආදායමක් අහිමිවීමක් තමයි වෙන්නේ. ඒ නිසා අපි බදු මුදල් සංශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කරමු.

03.12 ." ඩෙංගු වැඩසටහන- වියදම් ඇස්තමේන්තුව " යන මැයෙන් පරිසර නිළධාරී විසින් ඉදිරිපත් කරන ලද වියදම් ඇස්තමේන්තුව සභා ගත කරන ලදි.

03.13 ." එක්වන් මුදල ගෙවා නිම කිරීමට සහන ක්‍රම වේදයක් ඉල්ලා සිටීම " යන මැයෙන්මිශ්‍ර ආදායම් විෂය භාර නිළධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

සමන් සෙනෙවිරත්න ප්‍රජා ශාලාව , දංගහවිල, කරන්දෙණිය ලිපිනයේ තියෙන කඩ කාමර වලින් කරන්දෙණිය සභාවට අයවිය යුතු හිඟ එක්වන් මුදල ගෙවලා නිම කරන්න, අපි පොළ භූමියේ ඇති කඩකාමර වලට හඳුන්වා දීලා තියෙන ක්‍රමවේදය ම ලබා දෙන්න කියලා කඩ කාමර 02, 03, 04 කඩ හිමියන් ඉල්ලීමක් කරලා තියෙනවා. මේ කඩ කාමර වලින් 2022.12.31 දිනට මුළු හිඟ එක්වන් මුදලේ ශේෂය රුපියල් 2,163,200.00 ක් වෙනවා. දැන් තියෙන ආර්ථික අපහසුතා එක්ක සලකලා අපි මොවුන්ට පළමුව රුපියල් 100,000.00 ක් ගෙවලා ඉතිරිය මාසෙට රුපියල් 20,000.00 ගානේ ගෙවන්න අවස්ථාව ලබා දෙමු.

03.14 .ආධාරයක් අපේක්ෂාවෙන් ඇස්කින්වත්ත, නො.07, කිරිපේද්ද, කරන්දෙණිය ලිපිනයෙහි පදිංචි එස්.එච්. රොස්ලින් මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.15 .භාණ්ඩ වෙන්දේසිය පැවැත්වීම සඳහා සුදුසු දිනයක් යෝජනා කරන ලෙස විෂය භාර නිළධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

ඒ සඳහා සුදුසු දිනයක් ගරු මන්ත්‍රීතුමන්ලා සාකඡා කරලා කියන්න.

03.16.ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණයේ පහල මහල අංක 03 කඩ කාමරයේ බදු කරුවන මහජ්දණ්ඩ ,කරන්දෙණිය පදිංචි පී.එස්. ප්‍රේමවංශ මහතා 2022.10.21 දින මිය යාම හේතුවෙන් ඔහුගේ භාර්යාව වන 26101/ B , මහජ්දණ්ඩ ,කරන්දෙණිය නිවසේ පදිංචි පී.එච්.ලක්ෂමී මියට එම කඩ කාමරය පැවරීම පිළිබඳව විෂයභාර නිළධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගතකරනලදි.

03.17 ." අංක 91 ඩී උණගස්වෙල ග්‍රාමසේවා වසමේ උණගස්වල ඉහල පාර දෙපස පස් ඉවත් කර දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ඉදිරිපත් කරනලද ලිපිය සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය

ගරු සභාපතිතුමනි, මේ පාර පසුගිය දිනවලදී පිළිසකර කළා. එහිදී පාර දෙපැත්තේ කිහිප තැනකම පස් ගොඩ ගහලා තියෙනවා. ඒ පස් ඉවත් කරන්න JCB යන්ත්‍රය හා ටිපර් රථය යොදන්න පුළුවන් නම් හොඳයි.

03.18. මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන බොරකන්ද ,කරන්දෙණිය පදිංචි කේ.ඩී.ගුණසේකර මහතා ගේ කඩකාමරය පැවරීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදි.

03.19." බොරකන්ද රන්දොළ පන්සල පාර අලුත් වැඩියා කිරීම සඳහා " යන මැයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී. බන්දුසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී. බන්දුසිරි මැතිතුමා

ගරු සභාපති තුමනි,මේ පාර තාර දාලා සකස්කරපු පාරක්. දැන් ඉතා අබලන් තත්වයට පත්වෙලා තියෙන්නේ. ඒ නිසා මේ පාර අළුත් වැඩියා කරලා දෙන්න පුළුවන්නම් හොඳයි.

03.20." දකුණු පළාතේ , පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩල සඳහා නිල ඇඳුම් ලබාදීම " යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.21." ට්‍රැක්ටර් පැන්නුමක් (පාලමක්) සකස් කිරීම සඳහා " යන මැයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

-නොමැත-

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා -

### 5.1.1.ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා.

5.1.1.1. දක්ෂිණ සංවර්ධන අධිකාරියට අත්පත් කරගන ඇති කොහිල වගුරවත්ත ඉඩමෙන් සුසාන භූමිය සඳහා වෙන්කර ඇති හෙක්ටයාර් 0.5986 ප්‍රමාණය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවට අත්පත්කර ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂණී දීපිකා මැතිතුමිය විසින්_ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

දක්ෂිණ සංවර්ධන අධිකාරියේ පොදු කටයුත්තක් සඳහා අත්පත් කරගත්ත කොහිල වගුරවත්ත ඉඩම (හෙක්ටයාර් 76.1640 ප්‍රමාණය) අවසතු කිරීමට ඉඩම් අමාත්‍යාංශය වෙත ලේඛණ යොමුකරලා තියෙනවා කියලා ප්‍රාදේශීය ලේකම් තුමිය මාව ලිඛිතව දැන්වත් කරලා තියෙනවා. අපේ කොහිලවගුරවත්ත ඉඩමෙන් සුසාන භූමිය සඳහා වෙන්කරලා තියෙනවා හෙක්ටයාර් 0.5986 ඒ කියන්නේ අක්.01 රූඩ්.01 පර්.36 ක බිම් ප්‍රමාණයක්. ඒ නිසා මේ බිම් ප්‍රමාණය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවට අත්පත්කර ගන්න කියලා ප්‍රාදේශීය ලේකම් තුමිය මාව ලිඛිතව තවදුරටත් දැනුවත් කරලා තියෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමටයි මම මේ යෝජනාව සභාවට දැම්මේ.

ඒ අනුව දක්ෂිණ සංවර්ධන අධිකාරියේ පොදු කටයුත්තක් සඳහා අත්පත් කරගන්නා ලද කොහිල වගුරවත්ත ඉඩම (හෙක්ටයාර් 76.1640) ප්‍රමාණය අවසතු කිරීමට ඉඩම් අමාත්‍යාංශය වෙත ලේඛණ යොමුකර ඇති බැවින් කොහිල වගුරවත්ත ඉඩමෙන් සුසාන භූමිය සඳහා වෙන්කර ඇති හෙක්ටයාර් 0.5986 ( අක්.01 රූඩ්.01 පර්.36) බිම් ප්‍රමාණය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවට අත්පත්කර ගැනීම සඳහා ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂණී දීපිකා මැතිතුමිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය

5.1.1.2.කුරුඳුගහ සමගිපුර මාර්ගයේ අතුරු මාර්ගය බෝක්කුව දමා සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින්_ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මේ කුරුඳුගහ සමගිපුර මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කළ යුතු පාරක්. ඒ නිසා මම යෝජනා කරනවා අපි මේ මාර්ගය සංවර්ධනය කරමු කියලා.

ඒ අනුව කුරුඳුගහ සමගිපුර මාර්ගයේ අතුරු මාර්ගය තාර දමා සකස් කළ යුතු ප්‍රධාන මාර්ගයක් වන බැවින් එහි බෝක්කුව දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.1.3. කුරුඳුගහහැතැප්ම ප්‍රාදේශීය සභාව සතු අඩක් නිමකර ඇති ගොඩනැගිල්ල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ප්‍රතිපාදන මගින් අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි මේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කරන්නේ විශ්‍රාමික වැඩිහිටි ජනතාව වෙනුවෙන්. ඔවුන්ට විවේකීව ගත කරන්න ස්ථානයක් නැති නිසා කුරුඳුගහහැතැප්ම අපේ ප්‍රාදේශීය සභාව සතු අඩක් නිමකර ඇති ගොඩනැගිල්ල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ප්‍රතිපාදන මගින් අළුත්වැඩියා කරලා ඔවුනට විවේකීව ගත කිරීම සඳහා සකස් කර දීමට තමයි මම මේ යෝජනාව දැම්මේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මේ ගොඩනැගිල්ල වටේ ආවරණය කරලා සිමෙන්ති දාලා දුන්නොත් නගර මධ්‍යයේ තියෙන ප්‍රජා ශාලා ගොඩනැගිල්ලක් විදියටත් ගන්න පුළුවන් වෙයි.

ඒ අනුව කුරුඳුගහහැතැප්ම ප්‍රාදේශීය සභාව සතු අඩක් නිමකර ඇති ගොඩනැගිල්ල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ප්‍රතිපාදන මගින් අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.1.4. සඳුදා දින පැවැත්වීමට තීරණය කර තිබූ මහජ්දණ්ඩ පොළ ටෙන්ඩර් කර ලබා දීමට වෙළෙන්දන් නොමැති බැවින් මුදල් අය කිරීමකින් තොරව මාස 06 ක කාලයක් බ්‍රහස්පතින්දා දින පවත්වාගන යාම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

සඳුදා දවසේ පවත්වන්න තීරණය කරලා තිබුණ මහජ්දණ්ඩ පොළ ටෙන්ඩර් කරාට ගන්න වෙළෙන්දන් ඉදිරිපත් වුනේ නැති හින්දා මේ වන කොට ඒ සති පොළ වහලා තියෙන්නේ. ඒ හින්දා මුදල් අය කිරීමකින් තොරව මාස 06 ක කාලයක් බ්‍රහස්පතින්දා දවසේ පොළ පවත්වාගන යාම සුදුසුයි කියලයි මම යෝජනා කරන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව වෙළඳ ප්‍රජාවගේ ඇත්තටම ලොකු කැමැත්තක් තියෙනවා. ප්‍රචාරය යැවීමක් කරන්න පුළුවන් නම් ඇත්තටම හොඳයි. අදම ආදායම් නිළධාරීන් මගින් ඌරගස්මංහන්දියේ වෙළඳ ප්‍රජාව දැනුවත් කරලා ලබන සතියේ නෙවෙයි ඊළග සතියේ පොළ දාමු.

ඒ අනුව සඳුදා දින පැවැත්වීමට තීරණය කර තිබූ මහජ්දණ්ඩ පොළ ටෙන්ඩර් කළ නමුත් ලබා ගැනීමට වෙළෙන්දන් ඉදිරිපත් නොවූ බැවින් මේ වන වට එම සති පොළ වසා දමා ඇති බැවින් මුදල් අය කිරීමකින් තොරව මාස 06 ක කාලයක් බ්‍රහස්පතින්දා දින පවත්වාගන යාම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.1.5.ස්ථිර කාර්ය මණ්ඩලය විශ්‍රාම යාම නිසා කණිෂ්ඨ සේවක තනතුරු 10 කට අධික ප්‍රමාණයක් පුරප්පාඩු වී පවතින අතර පවතින ආර්ථික බිඳවැටීම් හමුවේ හා විවිධ හේතු මත දෛනික පදනමින් බඳවාගත් සේවකයින් කිහිපදෙනෙකුද සේවය හැර ගොස් ඇති බැවින් සභාවේ එදිනෙදා අත්‍යවශ්‍ය කටයුතු ඉටු කිරීමේ දී ඇතිවන අවහිරතා නිරාකරණය කිරීම සඳහා වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවීමේ පදනම මත, වැඩ ක්ෂේත්‍ර කම්කරු 06 ක් සහ සෞඛ්‍ය කම්කරු 02 ක් අනියම් හෝ ආදේශක පදනම යටතේ බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

ස්ථිර කාර්ය මණ්ඩලය විශ්‍රාම ගිය නිසා කණිෂ්ඨ සේවක තනතුරු 10 කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩු වෙලා තියෙන්නේ. දැන් පවතින ආර්ථික බිඳවැටීම් හා විවිධ හේතු නිසා දෛනික පදනමින් බඳවාගත්තු සේවකයින් කිහිපදෙනෙක් සේවය හැර ගිහිල්ලා තියෙන නිසා සභාවේ එදිනෙදා අත්‍යවශ්‍ය කටයුතු ඉටු කරද්දී දැඩි අපහසුතාවයකට පත්වෙන්න වෙලා තියෙනවා ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයට. ඒ නිසා වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවීමේ පදනම මත, වැඩ ක්ෂේත්‍ර කම්කරු 06 ක් සහ සෞඛ්‍ය කම්කරු 02 ක් අනියම් හෝ ආදේශක පදනම යටතේ බඳවා ගැනීම සුදුසුයි කියලයි මම යෝජනා කරන්නේ.

ඒ අනුව ස්ථිර කාර්ය මණ්ඩලය විශ්‍රාම යාම නිසා කණිෂ්ඨ සේවක තනතුරු 10 කට අධික ප්‍රමාණයක් පුරප්පාඩු වී පවතින අතර පවතින ආර්ථික බිඳවැටීම් හමුවේ හා විවිධ හේතු මත දෛනික පදනමින් බඳවාගත් සේවකයින් කිහිපදෙනෙකුද සේවය හැර ගොස් ඇති බැවින් සභාවේ එදිනෙදා අත්‍යවශ්‍ය කටයුතු ඉටු කිරීමේ දී ඇතිවන අවහිරතා නිරාකරණය කිරීම සඳහා වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවීමේ පදනම මත, වැඩ ක්ෂේත්‍ර කම්කරු 06 ක් සහ සෞඛ්‍ය කම්කරු 02 ක් අනියම් හෝ ආදේශක පදනම යටතේ බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිතුමිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.1.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්. කපිල කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

5.1.2.1 කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිළධාරි වසමේ එල්.එම්.පී මාවත ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ අලුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා

කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිළධාරී වසමේ එල්.එම්.පී මාවත මීට වසර හතරකට පෙර සකස් කරපු පාරක්. දැන් ඉතා අබලන් තත්වයේ පසුවන්නේ. ඒ නිසා මේ පාර ඉක්මනින් අළුත්වැඩියා කරන්න පුළුවන්නම් ඇත්තටම හොඳයි.

ඒ අනුව කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිළධාරී වසමේ එල්.එම්.පී මාවත ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2.2. කුරුඳුගහහැතැක්ම සෙවනගම ක්‍රීඩාංගනයේ දිවා රාත්‍රී ක්‍රීඩා කිරීම සඳහා විදුලි කණු සහිතව වොලි බෝල් ක්‍රීඩාංගනයක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා

කුරුඳුගහහැතැක්ම සෙවනගම ප්‍රදේශයේ තරුණ පිරිසකගේ ඉල්ලීමකට අනුවයි මම මේ යෝජනාව දැම්මේ. කුරුඳුගහහැතැක්ම සෙවනගම ක්‍රීඩාංගනයේ දිවා රාත්‍රී ක්‍රීඩා කරන්න විදුලි කණු සහිතව වොලි බෝල් ක්‍රීඩාංගනයක් සකස් කරලා දෙන්න කියලා ඒ ප්‍රදේශයේ තරුණ පිරිස මගෙන් ඉල්ලීමක් කළා. එයාලා උදේ ඉඳන් හවස් වෙනකන් රැකියාවල නිරත වෙන නිසා සෙල්ලම් කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නෑ. මෙහෙම දිවා රාත්‍රී ක්‍රීඩා කරන්න විදුලි කණු සහිතව වොලි බෝල් ක්‍රීඩාංගනයක් සකස් කරලා දුන්නොත් එයාලාට පුළුවන් වෙලාවට රාත්‍රී කාලයේදී සෙල්ලම් කරන්න අවස්ථාව ලැබෙනවා .

ඒ අනුව කුරුඳුගහහැතැක්ම සෙවනගම ක්‍රීඩාංගනයේ දිවා රාත්‍රී ක්‍රීඩා කිරීම සඳහා විදුලි කණු සහිතව වොලි බෝල් ක්‍රීඩාංගනයක් සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2.3. කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිළධාරී වසමේ අක්කර 700 කනත්ත ප්‍රජා ශාලාව සඳහා වැසිකිළියක් සකස් කිරීමට සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා

කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිළධාරී වසමේ අක්කර 700 කනත්ත ප්‍රජා ශාලාව තමයි සියළුම රැස්වීම් පැවැත්වීම සඳහා යොදාගන්නේ. ඒ වුනාට එහි මේ වන තුරුත් වැසිකිළි පද්ධතියක් ඉදිකරලා නැහැ. අපි වැසිකිළි පද්ධතියක් ඉදිකරලා දෙනවානම් ඉතාමත් වටිනවා මේ වෙලාවේ.

ඒ අනුව කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිළධාරී වසමේ අක්කර 700 කනත්ත ප්‍රජා ශාලාව සඳහා වැසිකිළියක් සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින්

කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 5.1.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාතුංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

5.1.3.1. ඌරගස්මංහන්දිය බෝගහවෙල ප්‍රධාන මාර්ගයේ සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති නාලක මහතාගේ නිවස අසල සිට සුනිල් මහතාගේ නිවස දක්වා ඇති කොටස ග්‍රාමීය ප්‍රජාවගේ ප්‍රජා දායකත්වයෙන් අප සභාව මගින් ගල් , වැලි, සිමෙන්ති ලබා දී සංවර්ධනය කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින්_ස්ථිර කරන ලදී.

<u>ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා</u>

ඌරගස්මංහන්දිය බෝගහවෙල ප්‍රධාන මාර්ගයේ සංවර්ධනය කරන්න ඉතිරිවෙලා තියෙන නාලක මහතාගේ නිවස අසල ඉඳන් සුනිල් මහතාගේ නිවස දක්වා තියෙන කොටස ග්‍රාමීය ප්‍රජාවගේ ප්‍රජා දායකත්වයෙන් අපේ සභාවෙන් ගල් , වැලි, සිමෙන්ති අරන් දීලා සංවර්ධනය කිරීම සුදුසුයි කියලයි මම යෝජනා කරන්නේ.

ඒ අනුව ඌරගස්මංහන්දිය බෝගහවෙල ප්‍රධාන මාර්ගයේ සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති නාලක මහතාගේ නිවස අසල සිට සුනිල් මහතාගේ නිවස දක්වා ඇති කොටස ග්‍රාමීය ප්‍රජාවගේ ප්‍රජා දායකත්වයෙන් අප සභාව මගින් ගල් , වැලි, සිමෙන්ති ලබා දී සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3.2. බෝගහවෙල අතුරු මාර්ගය චමිලා මහත්මියගේ නිවස අසල සිට සජිත් මහතාගේ නිවස දක්වා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දී සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින්_ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා</u>

බෝගහවෙල අතුරු මාර්ගයේ චමිලා මහත්මියගේ නිවස අසල ඉඳන් සජිත් මහතාගේ නිවස දක්වා මාර්ගය සභාව මගින් අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීලා ප්‍රජා දායකත්වයෙන් සංවර්ධනය කිරීම කරනවා නම් වඩාත් හොඳයි.

ඒ අනුව බෝගහවෙල අතුරු මාර්ගය චමිලා මහත්මියගේ නිවස අසල සිට සජිත් මහතාගේ නිවස දක්වා මාර්ගය මේ වන විට අබලන් තත්වයේ පසු වන බැවින් සභාව මගින් අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දී ප්‍රජා දායකත්වයෙන් සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3.3.සුභද්‍රපුර දේශප්‍රිය මහත්මියගේ නිවස අසල සිට සුරංග මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දී ප්‍රජා දායකත්වයෙන් සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා</u>

සුහදපුර දේශප්‍රිය මහත්මියගේ නිවස අසල ඉදන් සුරංග මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සකස් කරන්න අවශ්‍ය අමුද්‍රව්‍ය සභාවෙන් ලබා දීලා ප්‍රජා දායකත්වයෙන් සංවර්ධනය කිරීම සුදුසුයි කියලා මම ප්‍රකාශ කරන්න කැමතියි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

ගෙවල් තුනකට අඩුනම් ඒ පාර සංවර්ධනය කරන්න බැහැ. අවම ගෙවල් තුනක් තියෙන්න ඕන. අපි තාක්ෂණ නිළධාරී වාර්තාවක් අරගන ඉදිරි වැඩකටයුතු කරමු.

ඒ අනුව සුහදපුර දේශප්‍රිය මහත්මියගේ නිවස අසල සිට සුරංග මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දී ප්‍රජා දායකත්වයෙන් සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.1.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

5.1.4.1.93 C අඟනකැටිය ග්‍රාම නිළධාරී වසමේ විල්මන් මහතාගේ නිවස අසල සිට කුමුදු මහත්මියගේ නිවස දක්වා ඇති මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම ( 2 වන අදියර) සුදුසු යැයි මම යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා</u>

මේ 93 C අඟනකැටිය ග්‍රාම නිළධාරී වසමේ විල්මන් මහතාගේ නිවස අසල සිට කුමුදු මහත්මියගේ නිවස දක්වා තියෙන මාර්ගයේ පළමුව කොටසක් කැටගල් අල්ලා සංවර්ධනය කරා. දැන් එහි 2 වන අදියරය සඳහා අවශ්‍ය කටයුතු කරනවා නම් ඇත්ත වශයෙන්ම හොඳයි.

ඒ අනුව 93 C අඟනකැටිය ග්‍රාම නිළධාරී වසමේ විල්මන් මහතාගේ නිවස අසල සිට කුමුදු මහත්මියගේ නිවස දක්වා ඇති මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම ( 2 වන අදියර) සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. හදිසි යෝජනා

### 5.2.1.ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනා.

5.2.1.1. කරන්දෙණිය ප්‍රාදේශිය සභාව මගින් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වෙනත් ආයතන සඳහා පහත පරිදි ඉන්ධන ලබාදී ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| ලබා දී ඇති ආයතනය හා දිනය | ඉල්ලුම්කරුගේ නම | කාරණය | ප්‍රමාණය | වාහන අංකය | වටිනාකම |
|---|---|---|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | වයි.ඩී.ටී. ද සිල්වා මහතා | කර්මාන්ත පරීක්ෂාව සඳහා | ඩීසල් ලීටර් 25 | PB 0307 | රු.10,125.00 |

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

කර්මාන්ත පරීක්ෂාව හා විගණන කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අපි නිකුත් කරලා තියෙනවා. අපේ ආයතනයට සේවාවක් සපයන ආයතනවලට අපි අවස්ථාව ලබා දිය යුතුයි.

ඒ අනුව කරන්දෙණිය ප්‍රාදේශිය සභාව මගින් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වෙනත් ආයතන සඳහා ඉහත පරිදි ඉන්ධන ලබාදී ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.2. 2022.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව පොදු 47 වාර්තාවෙන් නිර්දේශ කර ඇති පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීම 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනිදාට පෙර දිනයක සිදුකිරීම සුදුසු බවත්, අපහරණ කමිටු නිර්දේශය මත භාණ්ඩ වෙන්දේසි කිරීම 2023.03.28 දින සිදු කිරීම " සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

විෂය භාර නිළධාරී විසින් 2022.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව පොදු 47 වාර්තාවෙන් නිර්දේශ කරලා තියෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීමට දිනයක් වෙන් කරන ලෙස මාව දැනුවත් කළා. ඒ අනුව භාණ්ඩ අපහරණය කිරීම 2023 වර්ෂයේ අප්‍රේල් මස

30 වැනිදාට පෙර දිනයක සිදුකිරිම සුදුසු බවට මම යෝජනා කරනවා. ඒ වගේම භාණ්ඩ වෙන්දේසි කිරීම 2023.03.28 දින සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා</u>

එමයෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව 2022.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව පොදු 47 වාර්තාවෙන් නිර්දේශ කර ඇති පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීම 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනිදාට පෙර දිනයක සිදුකිරිම සුදුසු බවත් භාණ්ඩ වෙන්දේසි කිරීම 2023.03.28 දින සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ගාමිණී අමරවංශ මුණසුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.3. 2023 මාර්තු මස 21, 23, 24 තෙදින තුල කුරුදුගහහැතැප්ම, කරන්දෙණිය, ඌරගස්මංහන්දිය යන නගර 03 තුල ඩෙංගු මර්ධන වැඩසටහනක් පැවැත්වීම සඳහා ඉදිරිපත් කර ඇති රුපියල් 111,750.00 ක පහත වියදම් ඇස්තමේන්තුව සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | අයිතමය | දින 03 | වටිනාකම |
|---|---|---|---|
| 1 | උදේ තේ පානය<br>කිරි පැකට් 50x120<br>ෂෝර්ටීස් 50x 100 | <br>3 x 6000.00<br>3 x 5000.00 | <br>18000.00<br>15000.00 |
| 2 | දිවා ආහාරය<br>50 x350.00 | 3 x 17500.00 | 52500.00 |
| 3 | අත් ආවරණ<br>35 x250.00 | 3 x 8750.00 | 26250.00 |
| | එකතුව | | 111750.00 |

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මැතිතුමා</u>
2023 මාර්තු මාසයේ 21, 23, 24 කියන දවස් තුනේ කුරුදුගහහැතැප්ම, කරන්දෙණිය, ඌරගස්මංහන්දිය යන නගර 03 නේ ඩෙංගු මර්ධන වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදා තියෙන බව විෂයභාර නිළධාරී විසින් මාව දැනුවත් කළා. ඒ සඳහා සකස් කරන ලද රුපියල් 111,750.00 ක වියදම් ඇස්තමේන්තුව සභාගත කරලා තියෙනවා. අපි ඒ සඳහා අවස්ථාව ලබා දෙමු.

ඒ අනුව 2023 මාර්තු මස 21, 23, 24 තෙදින තුල කුරුදුගහහැතැප්ම, කරන්දෙණිය, ඌරගස්මංහන්දිය යන නගර 03 තුල ඩෙංගු මර්ධන වැඩසටහනක් පැවැත්වීම සඳහා ඉදිරිපත් කර ඇති රුපියල් 111,750.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමතකිරිම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.4. නුගේතිබ්බූකන්ද ප්‍රාදේශීය සභා පෙර පාසලෙහි විදුලි බිල සභා අරමුදලින් ගෙවීම " සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

නුගේතිබ්බූකන්ද ප්‍රාදේශීය සභා පෙර පාසල් ගුරුතුමිය පවසන පරිදි පසුගිය වසර වල පෙර පාසලෙහි විදුලි බිල ගෙවීම් කටයුතු සිදු කරලා තියෙන්නේ දෙමාපියන් එක් අයකුගෙන් රුපියල් 30.00 ගානේ එකතු කරලා. පවතින ආර්ථික තත්වය හමුවේ එය ඉතා අසීරු කටයුත්තක් වෙලා තියෙනවා කියලා පෙරපාසල් ගුරුතුමිය විසින් දන්වලා තියෙනවා. කොහොමත් මේ අපේ සභාවේ පෙරපාසලක්. දෙමාපියන් ලවා ඒකේ විදුලි බිල ගෙවන එක ඇත්තටම හරි වැරදියි. අපේ සභාවටත් ඒක හොඳ නැහැ. ඒ නිසා ඒ විදුලි බිල සභා අරමුදලින් ඉදිරියට ගෙවීම සුදුසුයි කියලා මම කියනවා.

ඒ අනුව නුගේතිබ්බූකන්ද ප්‍රාදේශීය සභා පෙර පාසලෙහි විදුලි බිල සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.5. 2023.02.14 දින මහ සභා වාර්තාවේදී අපහරණ කමිටුව සඳහා නිලධාරීන් පත් කිරීමේ දි සිදු වී ඇති අතපසු වීම හේතුවෙන් තක්සේරු කමිටුවට හා අපහරණ කමිටුවට ඇතුළත් කළ යුතු නම් මගහැරී තිබෙනවා. එම නිසා පහත නිළධාරීන් තක්සේරු කමිටුවට හා අපහරණ කමිටුවට ඇතුළත් කර තක්සේරු කමිටුව හා අපහරණ කමිටුව සංශෝධනය කිරීමට මම යෝජනා කරනවා.

- ඩී.සී.ඩී.ගමගේ - අභ්‍යන්තර විගණක
- චතුරිකා විරන්තනී මිය - විමර්ෂණ නිළධාරී

එම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපිට ගිය මහ සභාවේදී අපහරණ කමිටුව හා තක්සේරු කමිටුව සඳහා නිලධාරීන් පත් කිරීමේ දි අභ්‍යන්තර විගණක හා විමර්ෂණ නිළධාරී ගේ නම් ඇතුළත් කිරීම මගහැරිලා තියෙනවා. ඒ නිසා ඒ දැනට පත් කරලා තියෙන නිළධාරීන්ට අමතරව අභ්‍යන්තර විගණක ගේ හා විමර්ෂණ නිළධාරීගේ නම් ඇතුලත්වෙන්න ඕන.

ඒ අනුව 2023. 02. 14 දින මහ සභාවේදී අපහරණ කමිටුව හා තක්සේරු කමිටුව සඳහා නිලධාරීන් පත් කිරීමේ දි අභ්‍යන්තර විගණක හා විමර්ෂණ නිළධාරී ගේ නම් ඇතුළත් කිරීම මගහැරී ඇත. එම නිසා දැනට පත්කර ඇති නිළධාරීන්ට අමතරව පහත නම් සඳහන් නිළධාරීන් දෙපළ අපහරණ කමිටුව සහ තක්සේරු කමිටුව සඳහා පත් කිරීම

- ඩී.සී.ඩී.ගමගේ - අභ්‍යන්තර විගණක - අපහරණ හා තක්සේරු කමිටුව සඳහා
- චතුරානි විරන්තනී මිය - විමර්ෂණ නිළධාරී- අපහරණ හා කත්සේරු කමිටුව සඳහා

සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.6. "කරන්දෙණිය නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරීමේදී භාණ්ඩ මිල ඉහල යාම සහ භාණ්ඩ හිඟ වීම හේතුවෙන් දින දීර්ඝ කර දෙන ලෙස විහාරා කන්ස්ට්‍රක්ෂන්, මහඒදණ්ඩ, කරන්දෙණිය විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කිරීම " සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

කරන්දෙණිය නගරයේ පොදු වැසිකිළිය ඉදිකරද්දී භාණ්ඩ මිල ඉහල යාමයි භාණ්ඩ හිඟ වීමයි නිසා නියමිත දිනට වැඩ අවසන් කරන්න නොහැකිවුන බව පවසමින් දින දීර්ඝ කර දෙන ලෙස විහාරා කන්ස්ට්‍රක්ෂන්, මහඒදණ්ඩ, කරන්දෙණිය විසින් ඉල්ලීමක් කරලා තිබුණා. ඒ 2021.03.11 සිට 2021.06.12 දක්වා කාලයට. මගේ අනුමැතිය මත ගිවිසුම් කාලය දීර්ඝ කරා. ඒ සඳහා සභා අනුමැතිය ලබාගන්න තමයි මේ හදිසි යෝජනාව දැම්මේ.

ඒ අනුව කරන්දෙණිය නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරීමේදී භාණ්ඩ මිල ඉහල යාම සහ භාණ්ඩ හිඟ වීම හේතුවෙන් දින දීර්ඝ කර දෙන ලෙස විහාරා කන්ස්ට්‍රක්ෂන්, මහඒදණ්ඩ, කරන්දෙණිය විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.7. "කරන්දෙණිය නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරීමේදී භාණ්ඩ මිල ඉහල යාම සහ භාණ්ඩ හිඟ වීම හේතුවෙන් නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වීම නිසා කර්මාන්තයේ දින දීර්ඝ කර දෙන ලෙස විහාරා කන්ස්ට්‍රක්ෂන්, මහඒදණ්ඩ, කරන්දෙණිය විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කිරීම " සුදුසු බවට යෝජනා කරමි.
එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

කරන්දෙණිය පොදු වැසිකිළිය ඉදිකිරීමේදී කර්මාන්තයේ ගිවිසුම් කාලය ඉකුත්වීම නිසා දින දීර්ඝ කර දෙන ලෙස විහාරා කන්ස්ට්‍රක්ෂන්, මහඒදණ්ඩ, කරන්දෙණිය විසින් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ අනුව ගිවිසුම් කාලය පහත පරිදි දින දීර්ඝ කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

| දින දීර්ඝ කළ යුතු කාලය | හේතුව |
|---|---|
| • 2022.03.01 සිට 2022.05.31 දක්වා | රටේ පැවති අයහපත් ආර්ථික තත්වය හා අරගලකාරී තත්වය හමුවේ 2022.05.09 දින කර්මාන්තකරුගේ නිවස ගිනි තැබීම හේතුවෙන් නිවසින් බැහැර වී සිටීමට සිදුවීම නිසා කර්මාන්ත කටයුතු සිදු කිරීමට නොහැකි වීම. |
| • 2022.06.01 සිට 2022.10.12 දක්වා | Tile සහ Bathroom උපාංග සභා අරමුදලින් මිලදීගෙන කර්මාන්තකරු වෙත ලබා දීම සඳහා ගත වූ කාලය |
| • 2022.10.13 සිට 2022.12.31 දක්වා | සභා අරමුදලින් ලබා දුන් Tile සහ Bathroom උපාංග සවි කර කර්මාන්තර කටයුතු නිම කිරිම සඳහා ගත වූ කාලය |

ඒ අනුව කරන්දෙණිය නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරීමේදී භාණ්ඩ මිල ඉහල යාම සහ භාණ්ඩ හිඟ වීම හේතුවෙන් වැඩ අවසන් කිරිමට නොහැකි වීමම නිසා දින දීර්ඝ කර දෙන ලෙස විහාරා කන්ස්ට්‍රක්ෂන්, මහඒදණ්ඩ, කරන්දෙණිය විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කිරීම " සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.9."කුරුඳුගහහැතැප්ම නගරයේ පොදු වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේදී අවශ්‍ය උපකරණ ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් වැඩ අවසන් කිරීම නියමිත දිනට සිදු කර ගැනීමට නොහැකි වූ බැවින් 2023.05.12 දක්වා දින දීර්ඝ කරන ලෙස එම්.එච්. තෙරේෂා, ජනශක්ති ප්‍රජා මූල සංවිධානය, කුරුඳුගහහැතැක්ම විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කිරීම " සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

කුරුඳුගහහැතැප්ම නගරයේ පොදු වැසිකිළි පද්ධතිය ඉදිකරද්දී ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාගන්න ප්‍රමාද වුණ නිසා දින දීර්ඝ කරලා දෙන්න කියලා එම්.එච්. තෙරේෂා, ජනශක්ති ප්‍රජාමූල සංවිධානය, කුරුඳුහ විසින් ඉල්ලීමක් කරලා තියෙනවා. අපි ඒ සඳහා අවසර දෙමු.

කුරුඳුගහහැතැප්ම නගරයේ පොදු වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේදී අවශ්‍ය උපකරණ ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් වැඩ අවසන් කිරීම නියමිත දිනට සිදු කර ගැනීමට නොහැකි වූ බැවින් 2023.03.26 දක්වා දින දීර්ඝ කරන ලෙස එම්.එච්. තෙරේෂා, ජනශක්ති ප්‍රජාමූල සංවිධානය, කුරුඳුගහ විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.10. ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණයේ පහල මහල අංක 03 කඩ කාමරයේ බදු කරුවන මහඒදණ්ඩ ,කරන්දෙණිය පදිංචි පී.එස්. ප්‍රේමවංශ මහතා 2022.10.21 දින මිය යාම හේතුවෙන් ඔහුගේ භාර්යාව වන 26101/ B , මහඒදණ්ඩ ,කරන්දෙණිය නිවසේ පදිංචි පී.එච්.ලක්ෂමී මියට එම කඩ කාමරය පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව පැවරීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණයේ පහල මහල අංක 03 කඩ කාමරයේ බදු කරුවන පී.එස්. ප්‍රේමවංශ මහතා 2022.10.21 දින මියගිය නිසා ඒ කඩකාමරය එතුමාගේ බිරිඳට පවරන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ස්වාමි පුරුෂයාගෙන් බිරිඳට පැවරීමක් වන නිසා මෙහිදී අපි පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව පවරා දීම සිදුකරමු.

ඒ අනුව ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණයේ පහල මහල අංක 03 කඩ කාමරයේ බදු කරුවන මහඒදණ්ඩ ,කරන්දෙණිය පදිංචි පී.එස්. ප්‍රේමවංශ මහතා 2022.10.21 දින මිය යාම හේතුවෙන් ඔහුගේ භාර්යාව වන 26101/ B , මහඒදණ්ඩ ,කරන්දෙණිය නිවසේ පදිංචි පී.එච්.ලක්ෂමී මියට එම කඩ කාමරය පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව පැවරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී

අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.11. "මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන බොරකන්ද , කරන්දෙණිය පදිංචි කේ.ඩී.ගුණසේකර මහතා ඔහුගේ භාර්යාව වන බොරකන්ද ,කරන්දෙණිය නිවසේ පදිංචි ඩබ්.ඩී.මල්ලිකා මියට එම කඩ කාමරය පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව පැවරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන කේ.ඩී.ගුණසේකර මහතා ඔහුගේ භාර්යාවට එම කඩකාමරය පවරා දෙන ලෙස ඉල්ලීමක් කරලා තියෙනවා. බිරිඳට පවරාදීමක් වන නිසා අපි පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව මේ කඩකාමරය ලබා දීමට කටයුතු කරමු.

ඒ අනුව මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන බොරකන්ද , කරන්දෙණිය පදිංචි කේ.ඩී.ගුණසේකර මහතා ඔහුගේ භාර්යාව වන බොරකන්ද ,කරන්දෙණිය නිවසේ පදිංචි ඩබ්.ඩී.මල්ලිකා මියට එම කඩ කාමරය පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව පැවරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.12. කරන්දෙණිය ප්‍රාදේශීය සභාවට අයත් බදු පදනම මත ලබා දී ඇති කඩකාමරවල බදු මුදල සංශෝධනය කිරීම 2015 වර්ෂයෙන් පසු සිදුකර නොමැති බැවින් එම බදු මුදල සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපේ සභාවට අයිති වෙළඳ සංකීර්ණ බහුතරයක බදු මුදල් 2015 වර්ෂයට පසු සංශෝධනය කරලා නැහැ. ඒක ඇත්තටම විගණන ගැටළු ඇතිවෙන්න හේතුවක් වෙන්න පුළුවන්. ඒ වගේම දීර්ඝකාලයකින් පසුව බදු සංශෝධනයක් සිදුකරොත් විශාල වශයෙන් බදු මුදල ඉහල යන නිසා අපිට විරෝධතා මතු වෙන්නත් ඉඩකඩ තියෙනවා. ඒ විතරක් නෙවෙයි මේකෙන් වෙන්නේ සභාවට ලබාගතහැකි ආදායම් අහිමි වීමක්. ඒ නිසා මම හදිසි යෝජනාවක් දැම්මේ මේ කඩකාමර බදු මුදල් සංශෝධනය කළයුතු නිසා මෙම සංශෝධනයට තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුයි.

ඒ අනුව සභාව සතු කඩකාමර බදු මුදල් සංශෝධනය කිරීම දීර්ඝ කාලයක සිට සිදුකර නොමැති බැවින් එම බදු මුදල් සංශෝධනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.13. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ලබාගත ඇති රුපියල් 570,000.00 ක ණය මුදල වෙනුවෙන් ගෙවීමට ඇති මුදල සහ අයකරන ලද පොලීය වන රුපියල් 697,224.00 ක ණය මුදල මාර්තු මස අවසන් වීමට පෙර ගෙවීම " සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි කුසල් කන්ද ප්‍රජා ශාලාව ඉදිකරන්න ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් රුපියල් 570,000.00 ක ණය මුදලක් ලබා ගත්තා. ඒ ණය ගෙවිය යුතු අවසන් දිනය ඉක්මවලා මේ වනකොට අවුරුදු 17 ක් විතර ගතවෙලා. මේ ආයතනය අපි ලබාගත්තු ණය මුදලට පොළිය අයකරලා තියෙන්නෙත් 2005 වසර දක්වා පමණයි. ඒ අවුරුද්දෙන් පසුව පොලී ගණනය කිරීමක් කරලත් නැහැ. ඒ පිළිබඳව ඒ ආයතනය අපිට දැනුම් දුන්නා. ඒක ඒ ආයතනය මඟින් අපට ලැබුණු ලොකු සහනයක්. දැන් මේ වනකොට අප ගෙවිය යුතු මුළු මුදල වන්නේ රුපියල් 697,224.00 ක් පමණයි. මේ මුදල මාර්තු මස අවසන් වීමට පෙර ගෙවන ලෙස එම ආයතනය දුරකථන ඇමතුමක් මඟින් දැනුම් දීලා තියෙනවා. පසුව අදාල තොරතුරු ලිඛිතව අපව දැනුවත් කරන බවත් ප්‍රකාශ කරලා තියෙනවා. ණය ගෙවීම තව දුරටත් කල් දැම්මොත් නීතිමය ගැටළුවකට මුහුණ දීමට සභාවට සිදු වන බවත් දැනුම් දී තිබෙනවා. ඒ නිසා තවත් කල් දාන්නේ නැතුව අපි මේ ණය මුදල ගෙවා අවසන් කරමු. නැත්නම් සභාව නැති කාලයක ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ලොකු ගැටළුවක් වෙන්න ඉඩ තියෙනවා.

ඒ අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ලබාගත ඇති රුපියල් 570,000.00 ක ණය මුදල වෙනුවෙන් ගෙවීමට ඇති ණය ශේෂය සහ අයකරන ලද පොලීය වන රුපියල් 697,224.00 ක ණය මුදල මාර්තු මස අවසන් වීමට පෙර ගෙවීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.14." කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අමරකීර්තිගම මහින්ද රාජපක්ෂ විදුහල ඉදිරිපස ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම" සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අමරකීර්තිගම මහින්ද රාජපක්ෂ විදුහල ඉදිරිපස ඇති මාර්ගය මේ වන කොට අවුරුදු 10 කට පෙර සංවර්ධනය කරපු පාරක්. මේ පාරේ දෙපැත්තේ කාපට් කැඩිලා. වාහන ගමන් කිරීමට නොහැකි තත්වයක් උදාවෙලා තියෙන්නේ. ඒ නිසා මේ මාර්ගය දෙපස කොන්ක්‍රීට් දාලා හදලා දෙන්න කියලා අමරකීර්තිගම, බොරකන්ද, කරන්දෙණිය ලිපිනයේ අරුණෝදය සුභ සාධක සහන සේවා සමිතිය මඟින් මට ඉල්ලීමක් කළා. ඒ නිසා අපි PRDA එකෙන් කාපට් කියුබ් එකක් ගෙනැල්ලා හදලා දාමු.

ඒ අනුව කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අමරකීර්තිගම මහින්ද රාජපක්ෂ විදුහල ඉදිරිපස ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව මන්ත්‍රී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.15." කැරුව- කැකිරිස්කන්ද හරහා ඌරගහ මාර්ගය අළුත්වැඩියා කිරීම" සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ලිපියක් මගින් මාව දැනුවත් කරලා තියෙනවා මාර්ග අංක 875/1 අම්බලන්ගොඩ- කැරුව- කැකිරිස්කන්ද හරහා ඌරගහ සේවාව සඳහා පොදු මගී ප්‍රවාහන බස් රථයක් යොදවලා තියෙන බවත් මෙම මාර්ගය ග්‍රාමීය මාර්ගයක් වන නිසා එක් බස් රථයක් පමණයි ධාවනය වෙන්නේ. මේ බස් රථය ධාවනය වන මාර්ගයේ පෙහෙඹියකන්ද හැල වෙල්ල මැද බෝක්කුව අසල කොන්ක්‍රීට් කුට්ටියක් කැඩී ගිය නිසා බස් රථය ධාවනයෙන් ඉවත්වෙලා තියෙන බවත් ඒකෙන් මේ ප්‍රදේශයේ ජනතාව මහත් අපහසුතාවයට පත්වෙලා තියෙන බවත් සඳහන් කරලා තියෙනවා. ඒ වගේම ගොඩක් අනතුරු වලටත් හේතුවක් වෙලා තියෙනවා. මේ පාරේ එක පැත්තක් හෝ ගල් දාලා හදන්න ඕන. මේක සංවර්ධනය විය යුතුම තැනක්. අපිට ලබන සභාවක් එනවට කියන්න බෑ. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය හා නිළධාරීන් දැනුවත් කරලා තියමු මේ සම්බන්ධයෙන්.

ඒ අනුව කැරුව- කැකිරිස්කන්ද හරහා ඌරගහ මාර්ගය අළුත්වැඩියා කිරීම" සුදුසු බවට_ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.16 ." සමන් සෙනෙවිරත්න ප්‍රජා ශාලාව , දංගහවිල, කරන්දෙණිය ලිපිනයේ තියෙන කඩ කාමර වලින් කරන්දෙණිය සභාවට අයවිය යුතු හිඟ එක්වන් මුදල ගෙවලා නිම කරන්න සහන ක්‍රම වේදයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

සමන් සෙනෙවිරත්න ප්‍රජා ශාලාව , දංගහවිල, කරන්දෙණිය ලිපිනයේ තියෙන කඩ කාමර වලින් කරන්දෙණිය සභාවට අයවිය යුතු හිඟ එක්වන් මුදල ගෙවලා නිම කරන්න, අපි පොළ භූමියේ ඇති කඩකාමර වලට හඳුන්වා දීලා තියෙන ක්‍රමවේදය ම ලබා දෙන්න කියලා කඩ කාමර 02, 03, 04 කඩ හිමියන් ඉල්ලීමක් කරලා තියෙනවා. මේ කඩ කාමර වලින් 2022.12.31 දිනට මුළු හිඟ එක්වන් මුදලේ ශේෂය රුපියල් 2,163,200.00 ක් වෙනවා. දැන් තියෙන ආර්ථික අපහසුතා එක්ක සලකලා අපි මොවුන්ට පළමුව රුපියල් 100,000.00 ක් ගෙවලා ඉතිරිය මාසෙට රුපියල් 20,000.00 ගානේ ගෙවන්න අවස්ථාව ලබා දෙමු.

ඒ අනුව සමන් සෙනෙවිරත්න ප්‍රජා ශාලාව , දංගහවිල, කරන්දෙණිය ලිපිනයේ තියෙන කඩ කාමර වලින් කරන්දෙණිය සභාවට අයවිය යුතු හිඟ එක්වන් මුදල ගෙවලා නිම කරන්න සහන ක්‍රම වේදයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.17. මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන බොරකන්ද , කරන්දෙණිය පදිංචි කේ.ඩී.ගුණසේකර මහතා ගේ කඩකාමරය ඔහුගේ භාර්යාව වන ඩබ්.ඩී.මල්ලිකා මහත්මියට පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපේ මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන බොරකන්ද , කරන්දෙණිය පදිංචිවෙලා ඉන්න කේ.ඩී.ගුණසේකර මහතා ඔහුගේ භාර්යාවට ඒ කියන්නේ ඩබ්.ඩී.මල්ලිකා මහත්මියට ඒ කඩ කාමරය පවරලා දෙන ලෙසට තමයි මේ ලිපිය ඉදිරිපත් කරන්නේ. මේ ස්වාමිපුරුෂයාගෙන් බිරිදට පැවරීමක් වෙන නිසා අපි පැවරුම් ගාස්තු අයකර ගැනීමකින් තොරව මේ කඩකාමරය පවරා දීමට කටයුතු කරමු.

ඒ අනුව මහජ්දණ්ඩ පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරයේ බදු කරුවන බොරකන්ද , කරන්දෙණිය පදිංචි කේ.ඩී.ගුණසේකර මහතා ගේ කඩකාමරය ඔහුගේ භාර්යාව වන ඩබ්.ඩී.මල්ලිකා මහත්මියට පැවරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.2.1.18. තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව රුපියල් 750.00 සිට රුපියල් 1000.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අනෙක් සභාවලත් මෙම කමිටු දීමනාව රු.1000.00 ක් ගෙවනවා. නමුත් අපේ සභාවේ තවම ගෙවන්නේ රුපියල් 750.00 ක මුදලක්. අපේ පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු මේ වන කොට සාර්ථකව කෙරෙනවා. ඒ නිසා මේ අවස්ථාව ලබා දෙමු.

ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව රුපියල් 750.00 සිට රුපියල් 1000.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.19. අංක WPPF-7389 දරණ කැබ් රථයට 2021.02.17 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මඟින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අංක WPPF-7389 දරණ කැබ් රථයට 2021.02.17 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ට අනුව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනවා. එම වාර්තාව අනුව මෙම අලාභය රියදුරුගේ දෝෂයක් හේතුවෙන් සිදුවූ බවක් අනාවරණය වන්නේ නැහැ. ඒ නිසා මේ රථය සහා අරමුදල් යොදවලා අලුත්වැඩියා කරලා තියෙනවා. පූර්ණ රක්ෂණාවරණයක් තිබෙන නිසා රක්ෂණාවරණය මගින් අපිට මේ හානිය ප්‍රතිපූර්ණය කරගන්න පුළුවන්. රක්ෂණාවරණය මගින් ගෙවූ මුදලට අමතරව යම් මුදලක් අලුත්වැඩියාවට වැයවෙලා තියෙනවා නම් ඒ මුදල් සහා අරමුදලින් දැරීම සුදුසු යි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව අංක WPPF-7389 දරණ කැබ් රථයට 2021.02.17 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.20. අංක 252-6570 දරණ කැබ් රථයට 2021.03.09 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

ඒ වගේම අංක 252-6570 දරණ කැබ් රථයට 2021.03.09 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ට අනුව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනවා. එම වාර්තාව අනුව මෙම අලාභය රියදුරුගේ දෝෂයක් හේතුවෙන් සිදුවූ බවක් අනාවරණය වන්නේ නැහැ. ඒ නිසා මේ රථය සහා අරමුදල් යොදවලා අලුත්වැඩියා කරලා තියෙනවා. පූර්ණ රක්ෂණාවරණයක් තිබෙන නිසා රක්ෂණාවරණය මගින් අපිට මේ හානිය ප්‍රතිපූර්ණය කරගන්න පුළුවන්. රක්ෂණාවරණය මගින් ගෙවූ මුදලට අමතරව යම් මුදලක් අලුත්වැඩියාවට වැයවෙලා තියෙනවා නම් ඒ මුදල් සහා අරමුදලින් දැරීම සුදුසු යි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව අංක 252-6570 දරණ කැබ් රථයට 2021.03.09 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.21. අංක SPRS 0928 දරණ ජේ.සී.බී.යන්ත්‍රය 2021.03.27 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

ඒ වගේම අංක SPRS 0928 දරණ ජේ.සී.බී.යන්ත්‍රය 2021.03.27 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ට අනුව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනවා. එම වාර්තාව අනුව මෙම අලාභය රියදුරුගේ දෝෂයක් හේතුවෙන් සිදුවූ බවක් අනාවරණය වන්නේ නැහැ. ඒ නිසා මේ රථය සහා අරමුදල් යොදවලා අලුත්වැඩියා කරලා තියෙනවා. පූර්ණ රක්ෂණාවරනයක් තිබෙන නිසා රක්ෂණාවරණය මගින් අපිට මේ හානිය ප්‍රතිපූර්ණය කරගන්න පුළුවන්. රක්ෂණාවරණය මගින් ගෙවූ මුදලට අමතරව යම් මුදලක් අලුත්වැඩියාවට වැයවෙලා තියෙනවා නම් ඒ මුදල් සභා අරමුදලින් දැරීම සුදුසු යි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව අංක SPRS 0928 දරණ ජේ.සී.බී.යන්ත්‍රය 2021.03.27 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති මැතිණිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.22. අංක SPZA 5217 දරණ FOTON යන්ත්‍රය 2020.11.30 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

ඒ වගේම අංක SPZA 5217 දරණ FOTON යන්ත්‍රය 2020.11.30 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ට අනුව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනවා. එම වාර්තාව අනුව මෙම අලාභය රියදුරුගේ දෝෂයක් හේතුවෙන් සිදුවූ බවක් අනාවරණය වන්නේ නැහැ. ඒ නිසා මේ රථය සහා අරමුදල් යොදවලා අලුත්වැඩියා කරලා තියෙනවා. පූර්ණ රක්ෂණාවරනයක් තිබෙන නිසා රක්ෂණාවරණය මගින් අපිට මේ හානිය ප්‍රතිපූර්ණය කරගන්න පුළුවන්. රක්ෂණාවරණය මගින් ගෙවූ මුදලට අමතරව යම් මුදලක් අලුත්වැඩියාවට වැයවෙලා තියෙනවා නම් ඒ මුදල් සභා අරමුදලින් දැරීම සුදුසු යි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව අංක SPZA 5217 දරණ FOTON යන්ත්‍රය 2020.11.30 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.23. අංක SPZA 5319 දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය 2020.11.25 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මගින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

ඒ වගේම අංක SPZA 5319 දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය 2020.11.25 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ට අනුව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනවා. එම වාර්තාව අනුව මෙම අලාභය රියදුරුගේ දෝෂයක් හේතුවෙන් සිදුවූ බවක් අනාවරණය වන්නේ නැහැ. ඒ නිසා මේ රථය සහා අරමුදල් යොදවලා අලුත්වැඩියා කරලා තියෙනවා. පූර්ණ රක්ෂණාවරනයක් තිබෙන නිසා රක්ෂණාවරණයක් තිබෙන නිසා රක්ෂණාවරණය මඟින් අපිට මේ හානිය ප්‍රතිපූර්ණය කරගන්න පුළුවන්. රක්ෂණාවරණය මඟින් ගෙවූ මුදලට අමතරව යම් මුදලක් අලුත්වැඩියාවට වැයවෙලා තියෙනවා නම් ඒ මුදල් සභා අරමුදලින් දැරීම සුදුසු යි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව අංක SPZA 5319 දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය 2020.11.25 දින සිදු වූ අලාභය සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතියටත් එම වාර්තාව අනුව සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය මඟින් ගෙවන මුදලට අමතරව දැරීමට සිදුවන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති මැතිණිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2.2.ගරු උපසභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනා.

5.2.2.1. " 2023.03.30,31 සහ 2023.04.01 යන දිනයන්හි අරුනළු උද්‍යාන විද්‍යා සංගමය මඟින් පැවැත්වීමට කටයුතු යොදා මල් කුටි හා පුටු සඳහා යන වියදම පියවා ගැනීම සඳහා රුපියල් 25000.00 ක මුදලක් සභා අරමුදලින් ලබා දීම ලබා දීම " සුදුසු බවට මම යෝජනා කරනවා.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2023.03.30,31 සහ 2023.04.01 යන දිනයන්හි අරුනළු උද්‍යාන විද්‍යා සංගමය මඟින් පැවැත්වීමට කටයුතු යොදා මල් කුටි හා පුටු සඳහා යන වියදම පියවා ගැනීම සඳහා රුපියල් 25000.00 ක මුදලක් සභා අරමුදලින් ලබා දීම ලබා දීම සුදුසු බවට ගරු උපසභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2.2. කරන්දෙණිය, ඌරගස්මංහන්දිය, කුරුදුගහහැතැප්ම යන බලප්‍රදේශ නියෝජනය කරමින් පවත්වනු ලබන බක්මහ උළෙලවල් සඳහා එක් වසමකින් එක් අවුරුදු උත්සවයක් පමණක් නියෝජනය වන පරිදි රුපියල් 5000.00 ක උපරිමයකට යටත්ව එක් කරගාවලියක් සඳහා පමණක් ත්‍යාග මුදලක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඕ.කේ .ධම්මික සුසන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා.

මේකෙදි අපිට වසම් 41 තිබෙන නිසා එක වසමකින් එක අවුරුදු උත්සවයක් පමණක් තෝරගමු. පළමුව අපෙන් ආධාර ඉල්ලන අවුරුදු උත්සවයක එක් තරගයක් සඳහා පමණක් රුපියල් 5000.00 ක උපරිමයකට යටත්ව ත්‍යාග මුදලක් ලබාදෙමු.

ඒ අනුව කරන්දෙණිය, ඌරගස්මංහන්දිය, කුරුදුගහහැතැප්ම යන බලප්‍රදේශ නියෝජනය කරමින් පවත්වනු ලබන බක්මහ උළෙලවල් සඳහා එක් වසමකින් එක් අවුරුදු උත්සවයක් පමණක් නියෝජනය වන පරිදි රුපියල් 5000.00 ක උපරිමයකට යටත්ව එක් කරගාවලියක් සඳහා පමණක් ත්‍යාග මුදලක් ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඕ.කේ .ධම්මික සුසන්ත මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.2.2.3."බෙලිගස්වෙල්ල ප්‍රජා ශාලාව සඳහා ඉවත් කරන ලද මේසයක් ලබා දීම " සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා</u>

බෙලිගස්වෙල්ල ප්‍රජා ශාලාව මේ දිනවල අලුත්වැඩියා කරනවා. ඒ නිසා ප්‍රජා ශාලාවට කාර්යාලයෙන් ඉවත් කරපු මේසයක් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි එය ලබා දීමට කටයුතු කරමු.

ඒ අනුව බෙලිගස්වෙල්ල ප්‍රජා ශාලාව සඳහා කාර්යාලයෙන් ඉවත් කරන ලද මේසයක් ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.2.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. සරත් ගුණරත්න මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනා.

5.2.3.1.ඌරගස්මංහන්දිය කයිලත්ත එච්.එච්.ධනපාල මහතාගේ නිවස අසලින් ඇති කුඹුර මැදින් ඕලුවපැන්න කන්ද මාර්ගය පස් දමා එක් පැත්තක ගල් වැටියක් බැදීම කළයුතු යැයි මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. සරත් ගුණරත්න මැතිතුමා</u>

මේ ඌරගහස්මංහන්දිය කයිලත්ත එච්.එච්.ධනපාල මහතාගේ නිවස අසලින් ඇති කුඹුර මැදින් ඕලුවපැන්න කන්ද මාර්ගය වැටිලා තියෙන්නේ. මේ මාර්ගය ගංවතුරට සේදී ගිහිල්ලා තියෙන්නේ. ඒ නිසා පස් දමා එක් පැත්තක ගල් වැටියක් බදින්න ඕන.

ඒ අනුව ඌරගස්මංහන්දිය කයිලත්ත එච්.එච්.ධනපාල මහතාගේ නිවස අසලින් ඇති කුඹුර මැදින් ඕලුවපැන්න කන්ද මාර්ගය පස් දමා එක් පැත්තක ගල් වැටියක් බැදීම කළයුතු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. සරත් ගුණරත්න මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සම්මත විය.

5.2.3.2.වාර්ෂිකව පවත්වනු ලබන ලේ දන් දීමේ කඳවුර මෙවර මාර්තු මස 15 වැනි දින ඌරගස්මංහන්දිය රත්නසිරි ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් සංවිධාන කටයුතු සඳහා අවශ්‍ය වන ශබ්දවාහිනී යන්ත්‍ර ලබා ගැනීම සඳහා රුපියල් 10,000.00 ක මුදල සහා අරමුදලින් ලබා දීම " සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. සරත් ගුණරත්න මැතිතුමා</u>

අපි මේ ලේ දන් දීමේ කඳවුර අප්‍රේල් 29 දින තමයි දාගන තිබුණේ. ඒත් මහරගම අපේක්ෂා රෝහලෙන් ඒ කඳවුර කඩිනම් කරන්න කියලා ඉල්ලීමක් කරපු නිසා අපි ඒ කඳවුර අප්‍රේල් 15 දින ඌරගස්මංහන්දියේ රතනසිරි ශාලාවේ පවත්වන්න තීරණය කළා. ඒ නිසා ශබ්දවාහිනී යන්ත්‍ර වලට යන වියදම සභා අරමුදලෙන් ලබා දෙන ලෙසයි මම මේ ඉල්ලීම කරන්නේ.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි මේ වගේ අවස්ථා වලදී අපේ සභාවේ සහයෝගය ලබා දිය යුතුයි. ඒ නිසා වැය අනුමැතියට ඉක්මනින් යවලා ඒ සඳහා කටයුතු කරමු.

ඒ අනුව වාර්ෂිකව පවත්වනු ලබන ලේ දං දීමේ කඳවුර මෙවර මාර්තු මස 15 වැනි දින ඌරගස්මංහන්දිය රත්නසිරි ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් සංවිධාන කටයුතු සඳහා අවශ්‍ය වන ශබ්දවාහිනී යන්ත්‍ර ලබා ගැනීම සඳහා රුපියල් 10,000.00 ක මුදල සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. සරත් ගුණරත්න මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.3.3. " ඌරගස්මංහන්දිය සිංහ ක්‍රීඩා සමාජය මඟින් 26 වෙනි වරටත් වාර්ෂිකව පවත්වනු ලබන සිංහ වසන්ත උදානය මෙවර 2023 අප්‍රේල් මස 18 වන දින පැවැත් වීමට කටයුතු යොදා ඇති බැවින් එහිදී වේදිකාව සකස් කර ගැනීම සඳහා වැය වන රුපියල් 60,000.00 ක මුදල සභා අරමුදලින් ලබා දීම" සුදුසු බවට මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව ඌරගස්මංහන්දිය සිංහ ක්‍රීඩා සමාජය මඟින් 26 වෙනි වරටත් වාර්ෂිකව පවත්වනු ලබන සිංහ වසන්ත උදානය මෙවර 2023 අප්‍රේල් මස 18 වන දින පැවැත් වීමට කටයුතු යොදා ඇති බැවින් එහිදී වේදිකාව සකස් කර ගැනීම සඳහා වැය වන රුපියල් 60,000.00 ක මුදල සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ගුණරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2.4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ගෙන එන ලද හදිසි යෝජනා

5.2.4.1. 39 C ඌරගහ නැගෙනහිර වසමේ තේවත්ත ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කළයුතු යැයි මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය</u>

මේ ප්‍රජා ශාලාවේ දොරවල් බල්ලන් විසින් කාලා විනාශ කරලා දාලා තියෙන්නේ. ඒ නිසා එය හැකි ඉක්මනින් ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඌරගහ නැගෙනහිර වසමේ ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කළයුතු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

## 5.2.5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඕ.කේ ධම්මික මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනා

5.2.5.1. සිරිපුර අක්කර 28 ප්‍රධාන මාර්ගයේ අධිවේගී කල්වට් එක ලඟ සිට ප්‍රියන්ත මහතාගේ නිවස අසලට යන පාර කොන්ක්‍රීට් කොට සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඕ.කේ ධම්මික මැතිතුමා</u>
මේ පාර දැන් අබලන් තත්වයේ පසුවන නිසා සංවර්ධනය කරනවා නම් ඇත්තටම හොඳයි.

ඒ අනුව සිරිපුර අක්කර 28 ප්‍රධාන මාර්ගයේ අධිවේගී කල්වට් එක ලඟ සිට ප්‍රියන්ත මහතාගේ නිවස අසලට යන පාර කොන්ක්‍රීට් කොට සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඕ.කේ ධම්මික මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

## 5.2.6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.එස්.එන්.විමලවීර මැතිණිය විසින් ගෙන එන ලද හදිසි යෝජනා

5.2.6.1.පෙහෙඹියකන්ද කැකිරිය මාර්ගයේ බෝක්කුව පිළිසකර කිරීම සුදුසු යැයි මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.එස්.එන්.විමලවීර මැතිණිය</u>
මේ පෙහෙඹියකන්ද කැකිරිය මාර්ගයේ පෙහෙඹියකන්ද මහවෙල බෝක්කුව අවට ප්‍රදේශය කැඩී ගිහින් තියෙන්නේ. ඒ මාර්ගයේ බස් රථයක්වත් ධාවනය කිරීමට නොහැකි නිසා බස් රථත් ධාවනයෙන් ඉවත්වෙලා තියෙන්නේ.ඒ නිසා ඒ බෝක්කුව පිළිසකර කර දෙනවා නම් ඇත්තටම හොඳයි.

ඒ අනුව පෙහෙඹියකන්ද කැකිරිය මාර්ගයේ බෝක්කුව පිළිසකර කිරීම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.එස්.එන්.විමලවීර මැතිණිය විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර ඩී ආරියරත්න මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනා.

5.2.7.1.අනුරුද්ධගම රණතිසර සුහසාධක සමිතියේ පානීය ජල ව්‍යාපෘතිය සඳහා යෝජිත යෝජනාවේ සඳහන් සමිතියේ පෙරපාසල පවත්වාගන යනු ලබන ඉඩම එම සමිතිය සතු ඉඩමක් වන බැවින් තාක්ෂණ නිළධාරී තුමියට එකී යෝජනාව ක්‍රියාත්මක කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දිම සුදුසු යැයි මම යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර ඩී ආරියරත්න මැතිතුමා</u>
අනුරුද්ධගම රණතිසර සුහසාධක සමිතියේ පානීය ජල ව්‍යාපෘතිය සඳහා යෝජිත යෝජනාවේ සඳහන් කරලා තියෙන් සමිතියේ පෙරපාසල පවත්වාගන යන ඉඩම ඒ සමිතිය සතු ඉඩමක් වන නිසාත් සභාව සතු ඉඩමක් නොවන නිසාත් එහි ළිඳක් ඉදිකිරීමට සභාවෙන් අවසර ගත යුතු බවට තාක්ෂණ නිළධාරී තුමිය මාව දැනුවත් කළා. ඒ නිසයි මම මේ හදිසි යෝජනාව දැම්මෙ.

ඒ අනුව අනුරුද්ධගම රණතිසර සුහසාධක සමිතියේ පානීය ජල ව්‍යාපෘතිය සඳහා යෝජිත යෝජනාවේ සඳහන් සමිතියේ පෙරපාසල පවත්වාගන යනු ලබන ඉඩම එම සමිතිය සතු ඉඩමක් වන බැවින් තාක්ෂණ නිළධාරී තුමියට එකී යෝජනාව ක්‍රියාත්මක කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දිම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර ඩී ආරියරත්න මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.2.7.2. 2022 මැයි 09 දින සිදු වූ සංවිධානාත්මක ප්‍රහාරයේදී හානියට ලක්වූ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් පස් දෙනාටත් සමස්ථ රටේම හානියට ලක්කරන ලද සියළුම දේශපාලන නායකයින්ට වන්දි ලබා දීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර ඩී ආරියරත්න මැතිතුමා</u>
මැතිවරණය සඳහා අප්‍රේල් 25 සුදුසු යැයි යොජනා කරලා තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය සුරකමින් එසේ කිරීම ඉතා ඉහලින් අගය කොට සලකනවා. මැතිවරණය සඳහා ආර්ථික වශයෙන් ශක්තිමත් භාණ්ඩාගාරයක් ශ්‍රී ලංකාව සතුව තියෙනවා නම් 2022 මැයි 09 දින සිදු වූ සංවිධානාත්මක ප්‍රහාරයේදී හානියට ලක්වුන අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් පස් දෙනාටත් සමස්ථ රටේම හානියට ලක්කරන ලද සියළුම දේශපාලන නායකයින්ටත් වන්දි ලබා දෙන්න කියලා බලධාරීන් දැනුවත් කරන්නයි මම මේ හදිසි යෝජනාව දැම්මෙ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා</u>
මැයි 09 වෙච්ච සිද්ධිය නිසා කරදරයට පත් වුණු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු පස් දෙනාට තවම සාධාරණයක් ඉටු වෙලා නැහැ. මේක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිරිහීමක්. මම ඒ පිළිබඳව ඇත්තටම ශෝක වෙනවා. අපේ සමීර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මෙහෙම හදිසි යෝජනාවක් දැම්මට.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රමාෘ ශ්‍රී විජේතුංග මැතිතුමා

රටේ දේශපාලනය කරන්න ගිහින් තමයි මේ ගෙවල් 05 ක්ම ගිනි තිබ්බේ. මේක රජයක් හැටියට බලන්න ඕන. රටේ ජනතාව ප්‍රශ්ණ ගොඩකට මැදිවෙලා ඉන්න මේ වෙලාවේ කළයුත්තේ මැතිවරණයකට වඩා මේ නිවාස අහිමි වූ අයට ඒ සඳහා වන්දි මුදලක් ගෙවීමයි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා
සමීර මන්ත්‍රී තුමා ගෙනාපු යෝජනාව නියම නීත්‍යානුකූල හදිසි යෝජනාවක්. පළාත් පාලන මැතිවරණය තියන්න මුදල් වියදම් කරන්න පුළුවන් නම් මැයි 09 සිදුවූ හානිය නිසා ඉන්න හිටින්න තැන් නැති වූ අයට වන්දි මුදල් දෙන්න කියලයි මගේ මතය. සමීර මන්ත්‍රී තුමා විග්‍රහ කළා බොහොම සාධාරණව. මම මේ සභාවේ මන්ත්‍රීතුමන්ලාට ගරු කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වූවාට. ඒ වගේම ඔබතුමාගේ යෝජනාවට ස්තුතිවන්ත වෙනවා.

ඒ අනුව 2022 මැයි 09 දින සිදු වූ සංවිධානාත්මක ප්‍රහාරයේදී හානියට ලක්වූ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් පස් දෙනාටත් සමස්ථ රටේම හානියට ලක්කරන ලද සියළුම දේශපාලන නායකයින්ට වන්දි ලබා දීම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර ඩී ආරියරත්න මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

## 5.2.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රිකා කාන්ති වීරසිංහ මැතිණිය විසින් ගෙන එන ලද හදිසි යෝජනා.

5.2.8.1.ඇස්කින්වත්ත, නො.07, කිරිපේද්ද, කරන්දෙණිය ලිපිනයේ පදිංචි එස්.එච්.රොස්ලින් මහත්මියට නිවාස ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.
එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියාණි පුංචිහේවා මැතිණිය
ගරු සභාපති තුමනි, මේ එස්.එච්.රොස්ලින් මහත්මිය අවුරුදු 75 ක් වයස තැනැත්තියක්. දරුවන්ගේ උදව්වක් නැතිව අසරණ වෙලා ඉන්න කාන්තාවක්. ජීවත් වෙන්න නිවසක් නැතුව අසල්වාසීන්ගේ උදව්වෙන් තමයි පොඩි කාමරකෑල්ලක් හදාගන තියෙන්නේ. ඒ නිවසේ ඉතිරි වැඩ ටික කර ගන්න ආධාර මුදලක් ඉල්ලනවා.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි තාක්ෂණ සේවා වාර්තාවක් අරගන ලක්ෂයක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ලබා දීමට කටයුතු කරමු.

ඒ අනුව ඇස්කින්වත්ත, නො.07, කිරිපේද්ද, කරන්දෙණිය ලිපිනයේ පදිංචි එස්.එච්.රොස්ලින් මහත්මියට නිවාස ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියාණි පුංචිහේවා මැතිණිය විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 07. වෙනත් කරුණු

### 07.01. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.

01.සිරිපුර අජිත් විජේකුමාර මහතාගේ නිවස අසළ පාර සංවර්ධනය කිරීම. (අදියර 2)

ඇස්තමේන්තු මුදල - රුපියල් 610,000.00

02.අඟනකැටිය ලාල් මහතාගේ නිවස අසලට යන පාර කැටගල් ඇල්ලීම.

ඇස්තමේන්තු මුදල - රුපියල් 1949,000.00

03. ඇල්පිටිය අම්බලන්ගොඩ ප්‍රධාන මාර්ගයේ මහජ්දණ්ඩ නගරයේ අමාකා අවන්හල අසලින් ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. (වර්ණපාල මුදලාලි මහතාගේ නිවස අසලින් වැටී ඇති අතුරු මාර්ගය )

ඇස්තමේන්තු මුදල - රුපියල් 1400,000.00

04.අඟනකැටිය සුදේශ් ධර්මප්‍රිය මහතාගේ නිවස අසල තල්ගහවත්ත, අඟනකැටිය මාර්ගයේ ඇස්කින්වත්ත පාර සංවර්ධනය කිරීම.

ඇස්තමේන්තු මුදල - රුපියල් 1041,000.00

05. අඟනකැටිය විල්මන් මහතාගේ නිවසේ සිට කුමුදු මහත්මියගේ නිවස දක්වා වැටී ඇති මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම දෙවන අදියර.

ඇස්තමේන්තු මුදල - රුපියල් 3,047,000.00

06.බෙලිගස්වෙල්ල ප්‍රජා ශාලාව අලුත්වැඩියා කිරීම.

ඇස්තමේන්තු මුදල - රුපියල් 1,450,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු සභා සම්මත කිරීම සුදුසු බවත් එම ඇස්තමේන්තු මුදල යටතේම එම කර්මාන්ත සිදු කිරීම සුදුසු බවත් ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 07.02 මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීම.

2023.03.10 දිනැති මුදල් කමිටු වාර්තාවේ නිර්දේශ පහත දක්වා ඇත.

01.SPHC 2813 අංක දරණ ටිපර් රථයේ ක්ලච් වොෂර් දැමීම සඳහා වන රුපියල් 6100.00 ක මුදල කරන්දෙණිය, මහජ්දණ්ඩ, අඹගහහන්දිය සුදත් මෝටර් ගරාජ් වෙත ගෙවීම සුදුසු බවටද එදින මුදල් කමිටුව තීරණය කරන ලදී.

02.252-6570 අංක දරණ මිට්ෂුබිෂි කැබ් රථයේ තිරිංග දෝෂ ඉවත් කිරීම සඳහා වන රුපියල් 69100.00 ක මුදල කරන්දෙණිය, මහජ්දණ්ඩ, අඹගහහන්දිය සුදත් මෝටර් ගරාජ් වෙත ගෙවීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

03.ලිපි ද්‍රව්‍ය ගබඩාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම යන මැයෙන් යුතුව ගබඩා භාර නිළධාරී විසින් කරන ලද පහත භාණ්ඩ මිලදී ගැනීම සඳහා සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

| | | |
|---|---|---|
| A4 බන්ඩල් | - | 50 |
| හාෆ්ෂීට් බන්ඩල් | - | 10 |
| තනි පැත්ත කාබන් | - | පැකට් 03 |
| දෙපැත්ත කාබන් | - | පැකට් 03 |
| 9*4 ලිපිකවර | - | 1000 |
| ෆයිල් ප්‍රමාණයේ ලිපිකවර | - | 250 |
| පිටු 80 CR | - | **10** |
| ස්ටෙප්ලර් කටු | - | 50 ( ලොකු) |
| ස්ටෙප්ලර් කටු | - | 20 (පොඩි) |
| සාමාන්‍ය ග්ලවුස් | - | 30( සෞඛ්‍ය කම්කරුවන් සඳහා) |

04.අඛණ්ඩ විදුලි සැපයුමක් තහවුරු කිරීම සඳහා වන කඩිනම් විදුලි සංරක්ෂණ වැඩසටහන යන මැයෙන් යුතුව පළාත් පාලන දෙපාර්තමේන්තුව (දකුණු පළාත) විසින් එවන ලද ලිපියට අනුව පහත තීරණ ගැනීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

- ප්‍රදේශයේ ආයතන වල පවත්නා නාම පුවරු දැන්වීම් පුවරු ආයතන විවෘතව ඇති වෙලාවල පමණක් දල්වා තබන ලෙස ආයතන දැනුවත් කිරීම.
- රාත්‍රී 10.00 න් පසු වීදි ලාම්පු නිවා දමන ලෙස ජනතාව දැනුවත් කිරීම.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

2023.02.14 දින පැවති මුදල් කමිටු වාර්තාවේ නිර්දේශයන්හි අඩු පාඩුවක් තිබේනම් එය පෙන්වා දෙන ලෙසටත් නොමැති නම් සභා සම්මත කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

2023.02.14 දින පැවති මුදල් කමිටු වාර්තාවේ නිර්දේශ ඉටු කිරීම කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා ස්ථිර කරන ලදි.

ඒ අනුව 2023.02.14 දිනැති මුදල් කමිටු වාර්තාවේ නිර්දේශ ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 08.01.ගෙවීම් වාර්තා සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

2023 පෙබරවාරි මස ගෙවීම් වාර්තා සහ 2023 මාර්තු 01 දින සිට 09 වන දින දක්වා ගෙවීම් වවුචර්පත්වල අඩු පාඩුවක් තිබේනම් එය පෙන්වා දෙන ලෙසටත් නොමැති නම් සභා සම්මත කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

2023 පෙබරවාරි මස ගෙවීම් වාර්තා සහ 2023 මාර්තු 01දින සිට 09 වන දින දක්වා ගෙවීම් වවුචර්පත්වල අඩු පාඩුවක් නොමැති බැවින් එම වාර්තා අනුමත කිරීම සුදුසු බවටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස් කපිල කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

2023 පෙබරවාරි මස ගෙවීම් වාර්තා සහ 2023 මාර්තු 01 දින සිට 09 වන දින දක්වා ගෙවීම් වවුචර්පත් සහා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා</u>

අපි වසර 05 ක කාලයක් තිස්සේ සභාවේ කටයුතු කළා. තාමත් අපි ජනතාව වෙනුවෙන් සේවය කරනවා. ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය අපි ඉතාමත් සහයෝගයෙන් කටයුතු කළා. මෙතෙක් කලක් අපිට සහයෝගය ලබා දුන්නට සියළුදෙනාටම ස්තුතිය ප්‍රකාශකර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර ඩී ආරියරත්න මැතිතුමා</u>

අපේ නිල වශයෙන් ධූර කාලය අවසන් වීගෙන යන මේ මොහොතේ අපේ අතින් වැරැද්දක් වුණානම් සමාව ඉල්ලා සිටිනවා. මම සභාවට එන විට වයස අවුරුදු 29 යි. මේ අවුරුදු 05 තුළ අත්දැකීම් විශාල සංඛ්‍යාවක් ලැබුවා. වචනයකින් හෝ එක බැල්මකින් හිත් රිදවුම් ඇති වුණා නම් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙනුත්, ලේකම් තුමිය ඇතුළු නිළධාරී මණ්ඩලයෙනුත් මම සමාව භජනය කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍යා ශ්‍රී විජේතුංග මැතිතුමා</u>

අපි 1997 ලාබාල මන්ත්‍රීවරු විදියටයි කරන්දෙණිය සභාවට ආවේ. අවුරුදු 20 ක් මම මගේ ජීවිතේ දේශපාලනය වෙනුවෙන් කැප කළා. ජීවිතයේ තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් කරන්දෙණිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් වැඩ කළා. මේ සභාවේ නොයෙකුත් පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු ඉන්නවා. නමුත් අපි කවුරුත් අශෝභන විදියට හැසිරිලා නැහැ. ඔබතුමියට කටයුතු කරගෙන යන්න උපරිම දායකත්වය ලබාදෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. සරත් ගුණරත්න මැතිතුමා</u>

අපි සියළු දෙනාම ඉතා සහයෝගයෙන් වැඩ කළා. මෙතන සභාවේ නොයෙකුත් පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු ඉන්නවා. නමුත් අපි සියළු දෙනාම සහයෝගයෙන් වැඩ කළා. මම සියළුම දෙනාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ලේකම් තුමිය ඇතුළු නිළධාරීන්ටත් මගේ ස්තුතිය පිරිනමනවා.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මාර්තු 19 පළාත් පාලන ආයතන ඉබේම විසිරෙනවා. ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිය පිරිනමනවා. මේ සභාව කරගෙන යන්න විශාල පිරිසක් උදව් වුණා. උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පිරිනමනවා.

09.නිමාව

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මෙම සභාවාරයේ කටයුතු මෙයින් අවසන් කරනවා. න්‍යාය පත්‍රානුකූලව අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහය ලබාදුන් සියළුම දෙනාට නැවතත් ස්තුති කරනවා.

සභාපති,
ගාමිණී අමරවංශ මුණුගොඩ
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

ඉහත සඳහන් වාර්තාව 2023.03.10 දින කරන්දෙණිය ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවති 2023 මාර්තු මස මහ සභාවේ සභා වාර්තාව ලෙස මෙයින් සහතික කරමි.